(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 30.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2015 දෙසැම්බර් මස 07 වැනි සඳුදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

19/'15

1.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) වර්ෂ 2011 - 2014 අතර කාලය තුළ සමුපකාර සංවර්ධන අරමුදලේ හා සමුපකාර අතිරික්ත අරමුදලේ රුපියල් මිලියන 897.06ක්, 1972 සමුපකාර සමිති පනතේ දැක්වෙන ප්‍රතිපාදනවලට පටහැනිව අවභාවිතා කිරීම සහ සාවද්‍ය පරිහරණයට ඉඩහැරීම යන චෝදනා යටතේ හිටපු අමාත්‍යවරයාට හා හිටපු සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයාට එරෙහිව පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසය වෙත පැමිණිලි කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) හි සඳහන් වන පැමිණිල්ලේ විමර්ශනවල ප්‍රගතිය කවරේද;

(ii) මෙම මුදල් අවභාවිතය හා සාවද්‍ය පරිහරණය පිළිබඳව පොදු දේපළ පනත යටතේ විමර්ශනයක් සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මුදල් අවභාවිතය හා සාවද්‍ය පරිහරණය පිළිබඳව ආයතනික මට්ටමින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) අහිමි වූ මුදල් යළි අයකර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

(iii) විෂයභාර අමාත්‍යවරයාගේ අභිමතය පරිදි පොදුවේ රාජ්‍ය අරමුදල් අවභාවිතය වැළැක්වීම සඳහා ඉදිරියේදී ක්‍රියාමාර්ග ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

39/'15

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ රැකියා අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2010 සිට 2014 දක්වා (එම වර්ෂ දෙකද ඇතුළත්ව) වසර 5 තුළ මැද පෙරදිග රටවලදී ලිංගික අපයෝජනයන්ට ලක්වූ ශ්‍රී ලාංකික කාන්තාවන් සංඛ්‍යාව වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාන්තාවන් සේවය කළ මැදපෙරදිග රටවල් කවරේද;

(iii) උක්ත එක් එක් කාන්තාව වෙනුවෙන් එම රටවල ශ්‍රී ලංකා තානාපති කාර්යාල විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත ලිංගික අපයෝජනයන්ට සම්බන්ධ පුද්ගලයන්ට එරෙහිව නීතිමය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම එක් එක් පුද්ගලයාට එරෙහිව ගත් පියවර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) විදෙස්ගත වන ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ ආරක්ෂාව පිළිබඳ පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

(iii) ශ්‍රී ලාංකික කාන්තාවන් ගෘහ සේවය සඳහා විදෙස්ගත වීම සීමා කිරීමට ගන්නා පියවර කවරේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

80/’15

3.

ගරු චන්දිම ගමගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) පසුගිය දශකයක පමණ කාලය තුළ පුරාවස්තූන් හා නිදන් වස්තූන් බරපතල ලෙස විනාශවීම් හා සොරුන්ගේ ග්‍රහණයට ලක්වීම් පිළිබඳව විවිධ මාධ්‍ය මගින් වාර්තාකර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ සම්බන්ධයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) මාධ්‍ය මගින් වාර්තා වූ සිද්ධීන් හා ලැබුණු පැමිණිලි සම්බන්ධයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් නීතිමය පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, නීතිමය පියවර ගෙන ඇති සිද්ධීන් හා පැමිණිලි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම නීතිමය ක්‍රියාමාර්ග තුළින් වැරදිකරුවන් කර ඇති පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) මෙවැනි සිද්ධීන් යළි ඇති නොවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

132/’15

4.

ගරු වාසුදේව නානායක්කාර මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සමූපකාර සමිති ව්‍යාපාරය පිළිබඳව පත්කරන ලද කොමිෂන් සභාවේ වාර්තාව එවකට ජනපතිනිය වූ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණියට භාර දී තිබුණේද;

(ii) එම වාර්තාව මේ වනතුරු එළිදක්වා නොමැති නම්, එයට හේතු කවරේද;

(iii) එය මහජනයා අතට පත්කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

181/'15

5\.
ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට 2015 දක්වා කාලය තුළ හඳුනාගෙන ඇති එච්.අයි.වී. (HIV) ආසාදිතයින් සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2015.10.30 දිනට හඳුනාගෙන ඇති මුළු HIV ආසාදිතයින් සංඛ්‍යාව කොපමණද;

(iii) දැනට හඳුනාගෙන ඇති සමස්ත රෝගීන් සංඛ්‍යාව, වයස් කාණ්ඩ අනුව (අවුරුදු 10-15, 16-20, 21-30, 31-40 සහ 40ට වැඩි) වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඒ අතර සිටින පාසැල් සිසුන් සංඛ්‍යාව කොපමණද;

(v) මෙම පිරිසට HIV ආසාදනය වී ඇති ආකාරය අදාළ සංඛ්‍යාව සමග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) රුධිර පාරවිලයනය හරහා ආසාදිත තත්ත්වයට පත්වූ රෝගීන් සඳහා රජය අනුගමනය කරනු ලබන නෛතික ක්‍රියාමාර්ගය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

42/'15

6\.
ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ හඳුන්කූරු හා සුවඳ දුම් කුඩු පරිභෝජනය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම ප්‍රමාණයෙන් ශ්‍රී ලංකාවේ නිපදවන හා පිටරටින් ගෙන්වන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) හඳුන්කූරු හා සුවඳ දුම් කුඩු සෑදීමට ගන්නා අමුද්‍රව්‍ය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මෙම අමුද්‍රව්‍ය මිනිස් සිරුරට අහිතකර ද නැද්ද යන්න පිළිබඳ පරීක්ෂා කරන ආයතනයක් රට තුළ තිබේද;

(iii) එසේ නම්, එම ආයතනයේ නම කවරේද;

(iv) එම ආයතනය මගින් පරීක්ෂා කිරීමේදී මිනිස් සිරුරට හානිකර අමුද්‍රව්‍ය භාවිතා කරමින් හඳුන්කූරු හා සුවඳ දුම් කුඩු නිෂ්පාදනය කළ ආයතන හඳුනාගෙන තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) හඳුන්කූරු හා සුවඳ දුම් නිෂ්පාදනය කිරීමේදී මිනිස් සිරුරට අහිතකර රසායන ද්‍රව්‍ය භාවිතය වැළැක්වීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"මඩකලපුව තරුණ ක්‍රිස්තියානි සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2016) — (දහතුන්වැනි වෙන් කළ දිනය) — කාරක සභාව. (දෙසැම්බර් 05 දින ප්‍රගතිය)

*2.

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ කරන නියෝගය,— 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 54 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ නිර්දේශය මත විදුලිබල (විදුලි පරීක්ෂකවරුන්ගේ කාර්යය, කර්තව්‍ය හා කාර්යය පටිපාටි) පිළිබඳව විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ජුනි 8 දිනැති අංක 1918/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.11.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

මුදල් අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝගය,— 2004 අංක 11 දරන මුදල් පනතේ 22 වැනි වගන්තිය සමග කියවිය යුතු 26 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 මැයි 18 දිනැති අංක 1915/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.11.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 ඔක්තෝබර් 2 දිනැති අංක 1934/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.11.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥා පනත යටතේ නිවේදනය,— කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වැනි අධිකාරය වන) සුරාබදු ආඥාපනතේ, 22 වැනි වගන්තියෙහි (1) වැනි උපවගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 ඔක්තෝබර් 2 දිනැති අංක 1934/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.11.21 වැනි දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 975, 976 සහ 977 දරන සුරාබදු නිවේදන)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

මුදල් අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 සැප්තැම්බර් 21 දිනැති අංක 1933/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.11.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

මුදල් අමාත්‍යතුමා,— රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ නියෝගය,— 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 13(1)(ඈ) වැනි වගන්තිය සහ 16 වැනි වගන්තිය සමග කියවිය යුතු, 112 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 මාර්තු 25 දිනැති අංක 1907/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.11.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

මුදල් අමාත්‍යතුමා,— දේශීය ආදායම් පනත යටතේ යෝජනාව,— 2015.09.23 දින ඉදිරිපත් කරන ලද, ආදායම් මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු පැහැර හැරීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ සිංගප්පූරු ජනරජයේ ආණ්ඩුව අතර, 2014 අප්‍රේල් මස 03 වැනි දින ඇතිකරගත් ගිවිසුම, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 97(1)(අ) වගන්තිය යටතේ අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා,— සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත යටතේ කරන නියමය,— 2002 අංක 25 දරන සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 අගෝස්තු 6 දිනැති අංක 1926/46 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.11.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

මුදල් අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2014 සැප්තැම්බර් 30 දිනැති අංක 1882/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— කලින් කලට සංශෝධනය කරන ලද (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 28 (අ) වැනි වගන්තිය සමඟ කියවිය යුතු, 16 (ඇ) වගන්තිය යටතේ සුරාබදු බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 පෙබරවාරි 13 දිනැති අංක 1901/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 973 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

## දිනට නියමිත කටයුතුවලට අදාළ සංශෝධන පිළිබඳ දැනුම්දීම

අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2016) නමැති පනත් කෙටුම්පතට කාරක සභාවේදී ඉදිරිපත් කරන සංශෝධන සඳහා වෙනම නිකුත් කළ "දිනට නියමිත කටයුතුවලට අදාළ අතිරේකය" නමැති පත්‍රිකාව බලන්න.

---